## පළාත් මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (මධ්‍යම හා සබරගමුව පළාත්) -2011

1. <u>මතය.</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තබුණු බව,

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (යෙන්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>.

2.1 <u>මූල්‍ය කාර්ය සාධනය.</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.571,861,200 ක් වූ අතර, 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.9,002,139,143 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, 2010 දෙසැම්බර් 31 දිනට වියදම සහ 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2010 දෙසැම්බර් 31 දක්වා වියදම | 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 483,633,113 | 6,614,695,346 | 7,098,328,459 |
| යන්ත්‍ර හා උපකරණ | - | 117,493,799 | 117,493,799 |
| මෝටර් වාහන | - | 48,257,308 | 48,257,308 |
| උපදේශක ගාස්තු | - | 1,040,816,130 | 1,040,816,130 |
| ව්‍යාපෘති පරිපාලන පිරිවැය | 8,106,079 | 226,609,246 | 234,715,325 |
| ණය පොළී | 80,122,008 | 382,137,104 | 462,259,112 |
| විශේෂ (යෙන්) ගිණුම සඳහා සේවා ගාස්තු | - | 269,010 | 269,010 |
| | 571,861,200 | 8,430,277,943 | 9,002,139,143 |

========== =========== ===========

2.2 **විශේෂ යෙන් ගිණුම.**

මූලාශ්‍ර ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (යෙන්) ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | ජපන් යෙන් | රු. |
|---|---|---|
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 97,914,323 | 133,271,185 |
| එකතු කළා - ඌන පූරණයන් | 225,776,140 | 302,540,028 |
| - විදේශ විනිමය වාසිය | - | 109,074 |
| | 323,690,463 | 435,920,287 |
| අඩු කළා - ආපසු ගැනීම් | 321,699,674 | 432,999,999 |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,990,789 | 2,920,288 |

5. **විගණන නිරීක්ෂණ.**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදනය කර තිබූ රු.43,098,000 ක්, රු.796,299 ක් හා රු.2,740,340 ක් වූ පිළිවෙළින් වාහන, ලී බඩු හා උපකරණ සහ පිරියත හා යන්ත්‍රෝපකරණ යනාදි ස්ථාවර වත්කම් එස්එල්පී - 96 ව්‍යාපෘතියට මාරු කර තිබුණ ද, එම වත්කම් ව්‍යාපෘතියේ වත්කම් ලෙස අඛණ්ඩව දක්වා තිබුණි.

(ආ) දුර්වල කාර්ය සාධනය හා නීතිමය කටයුතු හේතුවෙන්, මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තු 04 ක් අවසන් කර තිබුණි. රුපියල් මිලියන 03 බැගින් වූ රුපියල් මිලියන 06 ක අත්තිකාරමක් 2011 දෙසැම්බර් 27 දින නීතිමය කටයුතු සඳහා මධ්‍යම හා සබරගමුව පළාත් සභා සඳහා මුදා හැර තිබුණ ද, එම නීතිමය කටයුතු පිළිබඳ කාර්යය සාධනයන් 2012 සැප්තැම්බර් දක්වා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) **කොන්ත්‍රාත් අවලංගු කිරීම.**

i. පැකේජ අංක SIKG2-A යටතේ ප්‍රදානය කර තිබූ රුපියල් මිලියන 208.2 ක් වටිනාකම වූ කොන්ත්‍රාත්තු දුර්වල ප්‍රගතිය හේතුවෙන්, සබරගමුව පළාතේ පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අවලංගු කර තිබුණි. ඉදිකිරීම් සහතික අරමුදලේ කාර්ය සාධන හා අත්තිකාරම් ගෙවීම් ඇපකරයෙන් රුපියල් මිලියන 33.4 ක් මුදල් කර ගැනීමට ඉල්ලීමක් කර තිබුණ ද, නීතිපති දෙපාර්තමේන්තුව මගින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබූ පසුවත් සතුටුදායක ප්‍රතිචාරයක් ලැබී නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2012 ඔක්තෝබර් 18 දක්වා කිසිදු ප්‍රගතියක් විගණනයට වාර්තා වී නොතිබුණි.

ii. පැකේජ අංක SIRP2 යටතේ ක්‍රියාත්මක කරන ලද රුපියල් මිලියන 253.6 ක් වටිනාකම වු කොන්ත්‍රාත්තුවක් දුර්වල කාර්ය සාධනය හේතුවෙන්, 2008 ජුලි 03 සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර තිබුණි. කාර්ය සාධන හා අත්තිකාරම් ගෙවීම් ඇපකරයෙන් රුපියල් මිලියන 52.9 ක මුදලක් ගෙවීමට ඉල්ලීමක් කර තිබුණ ද, බැංකුව විසින් ඒ පිළිබඳ අවධානයක් යොමු කර නොතිබුණි. කෙසේ වුව ද, ව්‍යාපෘතිය විසින් නීතිපති දෙපාර්තමේන්තුව මගින් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබුණි. එහෙත්, මේ සම්බන්ධයෙන් 2012 ඔක්තෝබර් 18 දක්වා ප්‍රගතියක් වාර්තා නොවීය.

iii. පැකේජ අංක SIRP1 යටතේ වු රුපියල් මිලියන 264.8 ක කොන්ත්‍රාතතුව දුර්වල කාර්ය සාධනය හා ව්‍යාපෘතියට සිදුකරන ලද රුපියල් මිලියන 82.8 ක පාඩුව හේතුවෙන්, 2007 මැයි 09 දින අවලංගු කර තිබීමෙන්, කොන්ත්‍රාත්කරු විසින් රුපියල් මිලියන 300.1 ක මුදලක් ඉල්ලා තීරකවරයකු මාර්ගයෙන් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබුණි. මෙම නඩුව 2012 ඔක්තෝබර් 18 වන විටත් තීන්දුවක් අපෙක්ෂාවෙන් පවතී.

iv. පැකේජ අංක CIKDI යටතේ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමන ලද රුපියල් මිලියන 276.1 ක් වටිනා කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක නොවීම හේතුවෙන්, 2007 ජුනි 05 දින ව්‍යාපෘතිය විසින් අවලංගු කර තිබුණු අතර, බැංකු සහතිකය හා කාර්ය සාධන බැදුම්කරය මුදල් කර ගැනීමෙන් පස රුපියල් මිලියන 69 ක මුදලක් අයකර ගෙන තිබුණි. කෙසේ වුව ද, කොන්ත්‍රාත්කරු විසින් දරන ලද පාඩු වෙනුවෙන් රුපියල් මිලියන 211.5 ක මුදලක් ඉල්ලමින් කොන්ත්‍රාත්කරු විසින් ආරවුල් විනිශ්චය මණ්ඩලයේ (Dispute Adjudication Board) නඩුවක් ගොනු කර තිබුණි. මේ අතර, ව්‍යාපෘතිය විසින් රුපියල් මිලියන 108 ක මුදලක් ඉහත මුදලට අමතරව වන්දි වශයෙන් ඉල්ලීම් කර තිබුණි. 2012 ඔක්තෝබර් 18 දින වන විට මෙම නඩුව තීන්දුවක් අපේක්ෂාවෙන් පවති.